කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E2063 - විගණනය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

01. ගම්පහ පිහිටි විගණන ආයතනයක් වන එම්.සී.එන් ඇසෝසියේට්ස් හි ජ්‍යෙෂ්ඨ විගණන කළමණාකරු ලෙස මෑතකදී ඔබව බඳවා ගන්නා ලදී. සමූහ ව්‍යාපාර විගණනයක ප්‍රධාන විගණක වන ජාත්‍යාන්තර තලයේ විගණක සමාගමක් විසින් එවන ලද සමාලෝචන ප්‍රශ්නාවලියකට පිළිතුරු සැපයීම සඳහා සහාය විගණක කළමනාකරු වන කෝසල රණවීර මහතාට අවශ්‍ය මඟපෙන්වීම කරන ලෙස විගණක හවුල්කරු ඔබගෙන් ඉල්ලන ලදී. කෝසල සමඟ පැවති සාකච්ඡාවේදී මෙම සමාගම සමූහ ව්‍යාපාර විගණනයක අමතර විගණක (පරිපාලිත සමාගමේ විගණක) ලෙස සම්බන්ධ වන පළමු වතාව බව ඔබ විසින් දැන ගන්නා ලදී. තවද ඔබ විසින් විගණන ලිපි ගොනුව තුල පහත දුර්වලතා ද හඳුනාගන්නා ලදී.

1. විධිමත් විගණන වැඩ සටහනක් නොමැති වීම.
2. විගණන කළමනාකරු විසින් සමාලෝචක ලෙස වැඩ පත්‍රිකාවල අත්සන් සහ දිනය යොදා නොතිබීම.
3. විගණක සේවා මඩුල්ල විසින් වැඩ පත්‍රිකා අත්සන් කොට තිබුණද දිනය යොදා නොතිබිම.
4. විගණක පරීක්ෂණ ලැයිස්තු, කළමනාකරන ලිපිය සහ එයට පිළිතුරු විගණක ලිපි ගොනුව තුල නොතිබිම.
5. ප්‍රමාණාත්මක මට්ටම ගණනය කිරීම් සහ නියැදියෙහි ප්‍රමාණය තෝරා ගැනීමේ පදනම පැහැදිලි ලෙස ලේඛණගත කර නොතිබිම.
6. සමාලෝචන ප්‍රශ්නාවලිය තුල තිබූ ඇතැම් ප්‍රධාන ගැටළු සඳහා පැහැදිලි පිළිතුරු ලබා නොගෙන විගණක මතය පළ කර තිබිම.
7. ඇතැම් වැදගත් අනුපාත සහ ගණුදෙනු විශලේෂණ ලේඛණගත කර නොතිබිම.

විගණක ලිපිගොනුව සම්බන්ධව කල විචාරාත්මක සමාලෝචනයෙන් අනතුරුව මෙම විගණන ආයතනය තුල තත්ත්ව පාලන ගැටළුවක් ඇති බව ඔබ විසින් වටහා ගන්නා ලදී.
ජ්‍යෂ්ඨ විගණක කළමනාකරු ලෙස තනි තනි විගණනයන් සඳහා හඳුනාගත් ගැටළු මඟහරවා ගැනීමට මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය යටතේ සුදුසු තත්ත්ව පාලන පටිපාටින් සැලසුම් කරන්න.

(මුළු ලකුණු 30 )

02. අ. ටැන්ජරින් (පුද්ගලික) සමාගම සඳහා විගණක කාර්යය ලිපිය (Audit Engagement letter) ඔබ විසින් සකසා අවසන් කරනු ලැබ ඇත. මෙම සමාගම සතුව තිබෙන පරිපාලිතයන් (Subsidiaries) දෙක සඳහා විගණක කාර්යය ලිපි සැකසීමට කැමති බව ඔබ යටතේ සිටින කණිෂ්ඨ විගණක සාමාජිකයෙකු විසින් පවසන ලදී. මෙම පරිපාලිතයන් දෙක සඳහා විගණක කාර්යය ලිපි සැකසීම අවශ්‍යය ද යන්න තීරණය කිරීමේදී ඔබ විසින් සලකා බලනු ලබන කරුණු කවරේද ?

(ලකුණු 10 )

ආ. ඔබගේ ජ්‍යෙෂ්ඨ විගණක කළමනාකරු විසින් නව සේවා දායකයෙකු සඳහා විගණක කාර්යය ලිපිය (Audit Engagement letter) සකසන ලෙස ඔබෙන් ඉල්ලා සිටින ලදී. මෙම ලිපියෙහි ඔබ ඇතුලත් කරන්නේ කවරේද ? ( අවම වශයෙන් අයිතම 5 ක් වත් ලැයිස්තුගත කරන්න. )

(ලකුණු 10 )

(මුළු ලකුණු 20 )

03. සහතික කිරීමේ සේවා වලට අදාල ශ්‍රී ලංකා රාමුවට අනුව ගිවිසුමක් ප්‍රතිග්‍රහණය කිරීමට සුදුසු නිර්ණායකයන් තිබිය යුතුය.

අ. සහතික කිරීමේ සේවාවක සුදුසු නිර්ණායකයක් යන්නෙහි අදහස කුමක්ද ?

(ලකුණු 02)

ආ. සුදුසු නිර්ණායකයක පිළිඹිබු විය යුතු ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඉ. ඔබ විසින් ඔබගේ සේවා දායක සමඟ කරන ලද ප්‍රථම සාකච්ඡාවේදී, සේවා දායක විසින් මෙසේ පවසන ලදී. " අප ආයතනය සතුව ඉතාම සාර්ථක අභ්‍යන්තර පාලනයක් පවතී. එබැවින් කිසිවක් වැරදීමට අවස්ථාවක් නැත. " අභ්‍යන්තර පාලනයක් හා සබැඳිව පවතින ඔබගේ විගණන අවදානම ශුන්‍ය මට්ටමක පවතින බව ඔබ සිතන්නේ ද ? කෙටියෙන් පහදන්න.

(ලකුණු 10 )

(මුළු ලකුණු 20 )

04. ශ්‍රී.ලං.වි.ප්‍ර 300 - මූල්‍ය ප්‍රකාශ විගණන සැලසුම් කිරීම යටතේ ගිවිසුමක් ඵලදායි ලෙස ඉටු කිරීමට විගණනය සැලසුම් කිරීම විගණකවරයෙකුට අවශ්‍ය වේ.

අ. විගණන සැලැස්ම සමස්ත උපායමාර්ගයෙන් වෙන්කර දක්වන්න.

(ලකුණු 06 )

ආ. විගණක වරයෙකු විසින් ඉටුකල යුතු මූලික ගිවිසුම් ක්‍රියාවන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07 )

ඇ. විගණකවරයෙකු විසින් මූලික ගිවිසුම් ක්‍රියාවන්, විගණය ආරම්භයේ දී ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 07 )

(මුළු ලකුණු 20 )

05. පහත වචන කෙටියෙන් පහදන්න.

අ. අවංකභාවය

ආ. සීමිත සහතික වීමේ ගිවිසුම

ඇ. වංචාව

ඉ. විගණන ප්‍රමාණාත්මකභාවය.

ඊ. අභ්‍යන්තර පාලනය.

(මුළු ලකුණු 10 )